# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**10 ශ්‍රේණිය**

## ශිල්ප කලා - II

නම/ විභාග අංකයඃ ........................................

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.**

01) මිනුවන්ගොඩ කලාපයේ නොවිධිමත් අධ්‍යාපන ඒකකය සංවිධානය කරන අත්කම් ප්‍රදර්ශනය සඳහා මිනුවන්ගොඩ කලාපයේ ශිල්ප කලා විෂය හදරන පාසල් සිසුන්ට ද අවස්ථාව ලබා දී තිබුනි.

i. මෙම ප්‍රදර්ශනයට ඔබ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන විසිතුරු නිර්මාණ හතරක් ලියන්න.

ii. විසිතුරු නිර්මාණ කළ හැකි අපේ ජනකලා කර්මාන්ත හතරක් ලියන්න.

iii. සමාරම්භයේ දී දැල්වීමට අදහස් කරන දේශීය පොල්තෙල් පහනක රූප සටහනක් අඳින්න.

iv. ප්‍රදර්ශනය සඳහා විධිමත් රටා යොදාගෙන බිත්ති සැරසිල්ලක් සකස් කිරීමට සුදුසු වියමන් රටා දෙකක් නම් කරන්න.

v. ප්‍රදර්ශනය විවෘත කිරීම සඳහා ඇරයුම් කිරීමට ජ්‍යාමිතික හැඩතල යොදාගෙන සකස් කර ආරාධනා පතක මුල් පිටුව අඳින්න.

vi. ප්‍රදර්ශනයට පරිසර හිතකාමී ද්‍රව්‍ය උපයෝගී කරගෙන නිර්මාණ ඉදිරිපත් කිරීමට නියමිතය. එවැනි නිර්මාණ හතරක් නම් කරන්න.

vii. ප්‍රදර්ශනය ඉදිරිපස අලංකාර කිරීමට දේශීය මැටි බඳුන් භාවිතා කර තිබුනි. එවැනි මැටි බඳුන් වර්ග දෙකක් නම් කරන්න.

viii. ආරාධිත අමුත්තන් ප්‍රදර්ශන භූමියට කැඳවාගෙන ඒමට පාසලකින් තූර්ය වාදක කණ්ඩායමක් සහභාගී විය. එම බාලිකාවන්ගේ ඇඳුම් සැකසීමට සායම් භාවිතයෙන් කරන අලංකරණ ක්‍රම දෙකක් නම් කරන්න.

ix. ප්‍රදර්ශනයට භාණ්ඩ සකස් කිරීමෙන් ඔබට ස්වයං රැකියාවක් ලෙස කළ හැකි නිර්මාණ දෙකක් නම් කරන්න.

x. ඔබ ඉදිරිපත් කරන ප්‍රදර්ශන භාණ්ඩ සකස් කිරීමේ දී ඔබ තුළ ගොඩ නැගුණු ගුණාංග මොනවාද?

(ලකුණු 2x10=20)

02) එක් එක් පුද්ගලයාට සම්බන්ධ වූ ජීවන වෘත්තීන් හා බද්ධ වීමෙන් ජන කලාව බිහිවී ඇත.

i. පිත්තලවල ගුණාංග තුනක් ලියන්න. (ල 3)

ii. කෝලම් නාට්‍ය සඳහා සුදුසු වෙස් මුහුණු වර්ග තුනක් නම් කරන්න. (ල 3)

iii. ඔබ දන්නා ජනකලා හතරක් නම් කර ඒ සඳහා විශේෂ වූ ප්‍රදේශයක් බැගින් නම් කරන්න. (ල 4)

03) ශිල්ප කලා විෂයට අදළව සිසුන් විවිධ නිර්මාණ කිරීමටත් පන්ති කාමරය අලංකාර කිරීමටත් ජ්‍යාමිතික නිර්මාණ භාවිතා කරයි.

i. රොම්බසය හා රොම්බාභයේ ලක්ෂණ තුනක් ලියන්න. (ල 3)

ii. අරය 3cm වෘත්තයක් ඇඳ ඒ තුළ ෂඩාස්‍රයක් නිර්මාණය කරන්න. (ල 3)

iii. වෘත්තය ආශ්‍රිත නිර්මාණ රාශියක් කළ හැකිය. වෘත්තය ආශ්‍රයෙන් ඔබ කැමති නිර්මාණයක් සකස් කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල 4)

04) රෙදිපිළි තාක්ෂණයේ දී විවිධ කෙඳි වර්ග භාවිතා කර නූල් නිෂ්පාදනය කරයි.

i. කෙඳි ලබා ගන්නා ක්‍රම නම් කර ඒවාට උදහරණ එක බැගින් ලියන්න. (ල 3)

ii. කපු වර්ග නම් කර හොඳම කපු වර්ගය ලියන්න. (ල 3)

iii. රෙදි පෙර පිරියම් කිරීම යනු කුමක්දැයි හඳුන්වා රෙදි පෙර පිරියම් කිරීමේ ක්‍රම නම් කරන්න. (ල 4)

05) වර්තමානයේ දී රෙදිපිළි අලංකාර කිරීම සඳහා විවිධ ක්‍රම භාවිතා කරයි.

i. රෙදි පිළි අලංකාර කිරීමේ ක්‍රම තුනක් නම් කරන්න. (ල 3)

ii. ඉන් එක් ක්‍රමයකට රෙදි පින්තාරු කිරීමට සුදුසු මෝස්තරයක් අඳින්න. (ල 3)

iii. එය පින්තාරු කරන ආකාරය පියවර ලෙස ලියන්න. (ල 4)

06) දික් හරස් නූල් සම්බන්ධ වීමෙන් වියමන් රටා නිර්මාණය කරයි.

i. චාම් වියමන් රටාවේ ප්‍රභේධ නම් කරන්න. (ල 3)

ii. එම වියමන් වලින් වියා ගත හැකි රෙදි වර්ග එක බැගින් නම් කරන්න. (ල 3)

iii. එම වියමන්වල නූල් මතුවීම ඇඳ දක්වන්න. (ල 4)

07) මානව ශිෂ්ටාචාරයේ ආරම්භයත් සමඟම පැවත එන කලාවක් ලෙස මැටි ශිල්ප කලාව හැඳින්විය හැකිය.

i. මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රම තුනක් නම් කරන්න. (ල 3)

ii. මැටි භාණ්ඩ නිෂ්පාදකයකු දැනුවත්ව සිටිය යුතු මැටිවල භෞතික හා රසායනික ගුණ මොනවාද? (ල 3)

iii. මැටි දරනු ආශ්‍රයෙන් භාණ්ඩයක් සාද ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල 4)